දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E-mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

මගේ අංකය
எனது இல.
My No. PSC/EST/02-03/05/202

ඔබේ අංකය
உமது இல.
Your No.

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

දිනය
திகதி
Date
2024.06. 6

---

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

__වාර්ෂික ස්ථාන මාරු පටිපාටි සකස් කිරීම__

අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XVIII පරිච්ඡේදයෙහි සඳහන් රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථානමාරු සම්බන්ධයෙන් වන විධිවිධාන වලට ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

02. වාර්ෂික ස්ථානමාරු සමාලෝචන කමිටුව සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමේදී, එම කමිටුව සලකා බලන කරුණු අනුව අභියාචක වෙත ලබාදී ඇති ස්ථානමාරුව සංශෝධනය කිරීමට/ අවලංගු කිරීමට හැකි බව වාර්ෂික ස්ථානමාරු පටිපාටියේ සටහනක් යොදා ඇතුළත් කළ යුතුය.

03. වාර්ෂික ස්ථානමාරු නියෝගයකට එරෙහිව කරනු ලබන අභියාචනය සලකා බැලීමේදී එම ස්ථානමාරු චක්‍රයට අදාළ අනෙකුත් නිලධාරීන්ට අගතියක් නොවන පරිදි කටයුතු කළ යුතු හෙයින් අභියාචක වෙත ලබාදුන් ස්ථානමාරුව එලෙසින්ම ක්‍රියාත්මක කරන ලෙසත්, අභියාචක වෙත ඊළඟ වර්ෂයේ ස්ථානමාරු සඳහා අයදුම්කරන ලෙසත් දන්වන අවස්ථාවකදී එම අභියාචක විසින් නැවතත් ඊළඟ වර්ෂයේ ස්ථානමාරු අයදුම් කළ හොත්, එම සේවා ස්ථානයේ සේවා කාලය වසරක් පමණක් වුවද එම අවස්ථාවට පමණක් අවම සේවා කාලය නොසලකා කටයුතු කිරීම සඳහා ඉඩ සලසන බව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභිනියෝජිත පත්කිරීම් බලය දරන බලධරයින් විසින් අදාළ ස්ථානමාරු පටිපාටි වල ඇතුළත් කළ යුතු වේ.

04. වාර්ෂික ස්ථානමාරු ක්‍රමවේදය යටතේ ස්ථානමාරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට පවත්නා පුරප්පාඩු සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් නොමැති බැවින් සෑම වසරකම ස්ථානමාරු චක්‍රලේඛ නිකුත් කිරීමේදී එක් සේවා ස්ථානයක උපරිම සේවා කාලය සම්පූර්ණ කිරීම මත ස්ථානමාරු කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව සහ ආයතන ප්‍රසිද්ධ කළ යුතුය.

05. වාර්ෂික ස්ථානමාරු අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තීරණ ලබාගැනීමටද ප්‍රමාණවත් කාලයක් ලබාදිය හැකි වන පරිදි වාර්ෂික ස්ථානමාරු ක්‍රියාවලිය සෑම වසරකම මාර්තු 01 දිනයට පෙර ආරම්භ කරන ලෙසත් ඒ අනුව මෙම වසරේ ස්ථානමාරු ක්‍රියාවලිය කඩිනමින් ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

Mday

ඩබ්ලිව්. එච්. එම්. එම් සී. කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව